**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් ආනයනික සහ දේශීය වශයෙන් නිෂ්පාදිත සිමෙන්ති වල අනුකූලතාවය හෙවත් ප්‍රමිතිය තහවුරු කිරීමේ ක්‍රියාවලිය**

ආනයන හා අපනයන පාලක සහ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් පනවා ඇති රෙගුලාසි වලට අනුව ආනයනික සහ දේශීය වශයෙන් නිෂ්පාදිත සිමෙන්ති සඳහා ප්‍රමිති සහතිකය (SLS ලාංඡනය )ලබාගැනීම අනිවාර්ය කර ඇත .

ඒ අනුව දේශීය හෝ විදේශීය වශයෙන් නිෂ්පාදිත භාණ්ඩ සඳහා ප්‍රමිති ලාංඡන ලබාදීමේ මාර්ගෝපදේශ අනුගමනය කරමින් විෂයෙහි ප්‍රවීණ නිලධාරී කණ්ඩායම් අදාල දේශීය හෝ විදේශීය කර්මාන්ත ශාලා වෙත ගොස් සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියේ තත්ත්ව කළමනාකරණය පිළිබඳව නියමිත ක්‍රමවේද අනුගමනය කරමින් පූර්ණ අධ්‍යයනයකට ලක් කරනු ලබන අතර එම කර්මාන්ත ශාලා වලින් ලබාගන්නා සිමෙන්ති සාම්පල විදේශීය හෝ දේශීය වශයෙන් පිළිගත් පරීක්ෂණාගාර මගින් පූර්ණ තත්ත්ව පරීක්ෂණයන්ට ලක් කිරීමෙන් පසුව භාණ්ඩ සහතික කරන ලාංඡනය (SLS ලාංඡනය )ලබාදීම සිදු කෙරේ .

විදේශීය කර්මාන්තශාලා මඟින් නිපදවන භාණ්ඩ සඳහා SLS ලාංඡනය ලබා ගැනීමට එම කර්මාන්ත ශාලා, ISO 9001 තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකය ලබා ගෙන තිබීම අත්‍යාවශ්‍ය මූලික සාධකයකි

එසේ SLS සහතිකය ලබා ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සිමෙන්ති ,ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලබන අනිවාර්ය ආනයන පරීක්ෂණ ක්‍රියාවලියේ ක්‍රමවේදයන්ට අනුව අනුකූලතා ඇගයීමට ලක්කරන අතර ආනයනික තොග වලින් ලබාගන්නා සාම්පල නිරන්තරයෙන් පරීක්ෂාවට ලක් කෙරේ .

ශ්‍රී ලංකා ප්‍රමිතිය ආයතනයට පවරන ලද බලතල මත මෙවැනි ශක්තිමත් ක්‍රමවේදයක් හරහා මෙරටට ආනයනය කරනු ලබන සිමෙන්ති සෑම විටම ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල බව තහවුරු කර ප්‍රමාදයකින් තොරව වෙළඳපොළට මුදා හැරීමට හැකියාව ලැබී තිබේ . එසේම මෙම ක්‍රමවේද හරහා මෙරටට කිසිසේත්ම ප්‍රමිතියට අනුකූල නොවන සිමෙන්ති ගෙන්වීමට අවකාශයක් නොමැති අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සෑම විටම ප්‍රමිතියට අනුකූල වන සිමෙන්ති මහජනතාවට ලබා ගැනීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීමට බැඳී සිටියි .